**නියාගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 25 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**-------------------------**

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවා තිබුණු මුදල රු.527,154 ක් සහ සැපයුම් හා උපකරණවල වටිනාකම රු.48,855 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) කඩ බදුදීමේ දී අයකර ගෙන තිබුණු රු.11,150,200 ක් වූ එක්වන් මුදල් පොදු තැන්පත් ගිණුමට බැර කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අක්කර බදු ආදායම රු.500 ක් ද, වෙළඳ බලපත්‍ර ආදායම රු.49,000 ක් සහ කර්මාන්ත බදු ආදායම රු.52,000 ක් ද, වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට සේවකයින් 07 දෙනෙකුගේ වැටුප් රහිත නිවාඩු දින 39 ක් වෙනුවෙන් අයවිය යුතු රු.15,160 ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.188,909 ක අසමානතා විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.41,610,582 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සඳහා හිමිකම් ඔප්පුද, එකතුව රු.218,586 ක් වූ තැන්පතු සඳහා උපලේඛනද, එකතුව රු.299,142 ක් වූ කර්මාන්ත සම්බන්ධව ගිවිසුම්, ගෙවීම් වාර්තා, මිණුම් වාර්තා හා කර්මාන්ත ගොනු යනාදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) ප්‍රකාරව එකතුව රු.196,181 ක් වූ තැන්පතු ශේෂ 08 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,113,739 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.1,299,322 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,413,061 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| **වර්ෂය** | **මුළු පුනරාවර්තන ආදායම්** | **ආදායම් ආධාර** | **ස්වයං උත්පාදන ආදායම්** | **මුළු පුනරාවර්තන වියදම්** | **ස්වයං උත්පාදන ආදායම ඉක්මවා ගිය පුනරාවර්තන වියදම** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 34,729,908 | 20,585,222 | 14,144,686 | 28,616,169 | 14,471,483 |
| 2014 | 28,514,501 | 18,719,033 | 9,795,468 | 29,813,823 | 20,018,355 |
| 2013 | 22,084,201 | 9,679,260 | 12,404,941 | 21,251,645 | 8,846,704 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සභාවේ ආදායම් ආධාර ලැබීම් වල වර්ධනයක් පෙන්නුම් කෙරෙන නමුත්, සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණි. එම තත්ත්වය හඳුනාගෙන වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා රු.14,471,483 ක මුළු පුනරාවර්තන වියදම් උද්ගත වී තිබුණි.

(iii) සභාවට ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම්වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බව පෙන්නුම් කෙරුණි.

(iv) ඉහත අංක (i) සිට අංක (iii) දක්වා ඡේද වල දැක්වෙන කරුණු අනුව එම ආදායම් ඉහළ නංවා ගැනීමට සභාව විසින් අවධානය යොමු කළයුතු බවත්, ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත් මූල්‍ය පාලනයේ දූර්වලතාවය හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වියහැකි බවත් විගණනයේ අදහසයි.

(ආ) සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.5,213,075 ක ප්‍රාග්ධන වියදම් දරා තිබූ අතර, ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදමෙන් සත්‍ය වශයෙන් දරා තිබුණේ සියයට 09 ක තරම් අවම අගයක් පමණි.

**2.3 ආදායම් පරිපාලනය**

----------------------

**2.3.1 වරිපනම් හා අක්කර බදු**

--------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.436,624 ක හිඟ වරිපනම් ශේෂයක් ද, රු.87,344 ක් වූ අක්කර බදු ශේෂයක්ද වූ අතර, එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,812,268 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ තනතුරු 10 ක පුරප්පාඩු පැවති අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව 02 ක් විය. පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් රු.713,115 ක දායක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකර මිශ්‍ර තැන්පත් යටතේ රඳවාගෙන තිබුණි.

(ඇ) සේවකයන් 06 දෙනෙකුගෙන් රු.18,401 ක ණය ශේෂ අයවිය යුතුව තිබුණු නමුත්, එම ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පිටිගල මහවත්ත ප්‍රදේශයේ අක්කර 1 ½ ක ඉඩමක, රු.50,098,338 ක් වැයකර ගොඩනැගිල්ලක් සහ කොම්පෝස්ට් අංගනයක් ඉදිකර ස්ථාන භාරකරුවකු ඇතුළුව සේවකයින් තිදෙනෙකු අනුයුක්ත කර තිබුණු නමුත්, එම ස්ථානය 2015 ජුනි 15 දින සිට වසා දමා තිබුණි.

(ආ) මසකට රු.5,000 ක් බැගින් ගෙවා තාවකාලික පදනම මත වැවිලි සමාගමකට අයත් ඉඩමකට සභා බලප්‍රදේශයේ එකතු වන කසල බැහැර කර තිබුණද, සභාව විසින් ස්ථිර විසඳුමක් වෙනුවෙන් ක්‍රියාකර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.478,043 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.100,218,409 ක ඉතිරිකිරීමද, වෙනත් වියදම් විෂයයක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.1,475,114 ක වියදම් දරා තිබුණු අතර, ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් එකතුව රු.29,228,882 ක්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01 න.ව.ලේ. දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත)ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය